(5)

# මධ්‍යම පළාත් සභාවේ
## පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා
## <u>බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය</u>

1. <u>හැඳින්වීම</u>

1.1 "මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය" නමින් මෙම ව්‍යවස්ථා සංග්‍රහය හැඳින්වේ.

1.2 මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2008 . . ජූලි. මස .02. වන දින සිට වලංගු වනු ඇත. ඒ අනුව 1994.12.01 දිනැති සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ පරිපාටිය එදින සිට බල රහිතවේ.

1.3 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ "නිශ්චිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ 2008 . ජූලි . 02 දිනයයි.

1.4 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ මින් පසුව සඳහන් වන "ගරු ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරන්නේ මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාය.

1.5 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ මින් පසුව සඳහන් වන "පළාත් රාජ්‍ය සේවා කොමිෂම" යන්නෙන් අදහස් කරන්නේ මධ්‍යම පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂමයි.

1.6 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන "පළාත් ආදායම් දෙපාර්තමේන්තුව" යන්නෙන් අදහස් කරන්නේ මධ්‍යම පළාත් සභාවේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවයි.

1.7 මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ "පළාත් ආදායම් සේවය" යනුවෙන් අදහස් කරන්නේ මධ්‍යම පළාත් සභාවේ පළාත් ආදායම් සේවයයි.

2. <u>ව්‍යුහය</u>

2.1 පළාත් ආදායම් කොමසාරිස් තනතුරට පහත 3:1 සහ 3:2 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පත්කරනු ලැබූ නිලධාරියෙකු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේය.

2.2 මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් තනතුරු වලට පහතින් විස්තර කර ඇති කිනම් හෝ පන්ති වලට හා ශ්‍රේණි වලට පත් කරනු ලබන නිලධාරින්ගෙන් පළාත් ආදායම් සේවය සමන්විත වනු ඇත.

2.3 සේවක සංඛ්‍යාව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව තනතුරු වල වාර්ෂික වැටුප් පරිමාණ පහත සඳහන් පරිදිවේ.

(අ) පළාත් ආදායම් කොමසාරිස් - රු: 275220-10x7740-8x9480-17x12600-642660
( එස්එල් 1-2006 හි 20 වන පියවර)

<u>පළාත් ආදායම් සේවයේ අතිකුත් තනතුරු:-</u>

(ආ) පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස්

| <u>පන්තිය</u> | <u>සේවක සංඛ්‍යාව</u> | <u>වාර්ෂික වැටුප් පරිමාණය</u> |
|---|---|---|
| 1 පන්තිය | 01 | රු: 275220-10x7740-8x9480-17x12600-642660 ( එස්එල් 1/2006 හි 19 වන පියවර) |

(ඇ) පළාත් ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු/පළාත් තක්සේරුකරු

| <u>පන්තිය</u> | <u>වාර්ෂික වැටුප් පරිමාණය</u> | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 2 වන පන්තිය 1 වන ශ්‍රේණිය | රු:275220-10x7740-8x9480-17x12600-642660 ( එස්එල් 1-2006 හි 12 වන පියවර) | * 10 |
| 2 වන පන්තිය II වන ශ්‍රේණිය | රු:275220-10x7740-8x9480-17x12600-642660 ( එස්එල් 1-2006 හි ආරම්භක පියවර) | |

රු: 290700/- ට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම - පරිශිෂ්ඨයේ අංක අ(4) හි දැක්වෙන පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණය

රු: 337140/- ට පෙර 2 වන කාර්යක්ෂමතා කඩඉම - පරිශිෂ්ඨයේ අංක අ(5) හි දැක්වෙන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය

දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්වීමෙන් පසුව හා ශ්‍රේණියෙහි වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව නිලධාරියෙකු 352620/- ක වැටුප් පියවරෙහි තබනු ඇත.

* මෙය ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් දක්වයි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008/07/02 දින
අනුමත කරන ලදී.

(ඇ) ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි/බදු නිලධාරි

| පන්තිය | වාර්ෂික වැටුප් පරිමාණය | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 3 වන පන්තිය<br>I වන ශ්‍රේණිය<br>ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි | රු:189420-10x3480-15x3900-11x4800-335520<br>( එම්එන් 5-2006 හි 12 වන පියවර) | *<br>13 |
| 3 වන පන්තිය<br>II වන ශ්‍රේණිය<br>බදු නිලධාරි | රු:189420-10x3480-15x3900-11x4800-335520<br>( එම්එන් 5-2006 හි ආරම්භක පියවර) | |

* මෙය ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් දක්වයි.

2.4 රජය මගින් කලින් කලට කරනු ලබන වැටුප් සංශෝධනයන්හිදී ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ ඒ ඒ පන්ති වලට හා ශ්‍රේණි වලට අදාල වන වැටුප් පරිමාණ මෙම සේවයේ අනුරූපී පන්ති වලට හා ශ්‍රේණි වලට අදාල කරගනු ලැබේ.

2.5 ඉහතින් දක්වා තිබෙන ඒකාබද්ධ සේවක සංඛ්‍යාව සේවයේ නිශ්චිත අවශ්‍යතාවයන් අනුව කලින් කලට ප්‍රතිශෝධනය කරනු ලැබිය හැක.

2.6 පළාත් ආදායම් සේවයේ නිලධාරීහු පළාතේ ස්ථාපිත කර ඇති දෙපාර්තමේන්තුවය සහ හෝ ප්‍රාදේශීය කාර්යාලයකට පත්කර යවනු ලැබීමට යටත් වෙති.

03. නිලධාරීන් පත් කිරීම

3.1 පළාත් ආදායම් කොමසාරිස් තනතුරට පත්කිරීම පළාත් ආණ්ඩුකාරතුමා විසින් සිදු කරනු ඇත.

3.2 පළාත් ආදායම් කොමසාරිස් තනතුර ඇබැර්තු වූ විට පහත සඳහන් ක්‍රමයට එය පිරවිය යුතුය.
(අ) පළාත් ආදායම් සේවයේ පළමුවැනි පන්තියේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකුගෙන්.
(ආ) ඉහත (අ) යටතේ දක්වා ඇති නිලධාරියෙකු නොමැති නම් ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයෙන් සම්පූර්ණයෙන් මුදා හැරීමක් ලබාගත හැකි එම සේවයේ පළමුවැනි පන්තියේ නිලධාරියෙකුගෙන් හෝ
(ඇ) වෙනත් පළාත් ආදායම් සේවයක පළමුවැනි පන්තියේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකුගෙන්

3.3 පළාත් ආදායම් සේවයේ 1 වැනි 2 වැනි 3 වැනි පන්තිවලට පත්කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආයතන සංග්‍රහයේ නියෝගවලට අනුකූලව සිදු කරනු ඇත.

04. 3 වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගැනීම (බදු නිලධාරීන්)

4.1 පහත සඳහන් සුදුසුකම් ඇති ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අවම වශයෙන් මධ්‍යම පළාතේ අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට (පරිශිෂ්ඨ අ(1)) ලක්කොට එහි ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ඉහලම ලකුණු පදනම් කරගෙන බඳවා ගැනීම් සිදු කෙරේ.

(අ) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් හෝ නීතිඥයින් හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණ සහතිකය හෝ රජයේ උසස් තාක්ෂණායතනයක ගණකාධිකරණය, වාණිජ විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය හෝ වරලත් ගණකාධිකාරීන්ගේ කළමනාකරණ ආයතනයේ (CIMA – එක්සත් රාජධානිය ) I, II හා III යන කොටස් හෝ සමත් වූවන් හෝ ඊට සමාන යම් පරීක්ෂණයක් හෝ සමත්වූවන්.

(ඇ) වයස අවුරුදු 35 ට අඩු අය පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. (දැනටමත් රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින තනතුරේ ස්ථිර කර ඇති නිලධාරීන්ට ඉහතකී වයස් සීමාව අදාල නොවේ.)

(ඈ) නිශ්චිත දිනයේදී පළාත් රාජ්‍ය සේවයේ සේවය කරමින් සිටින, එදින වන විට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති වසර 10 ක සතුටුදායක සේවා කාලයක් ඇති ලිපිකාර හා සමාන්තර සේවාවන්ට අයත් නිලධාරීන්ද මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සන් වන අතර, ඉහත (ඇ) හි සඳහන් උපරිම වයස් සීමාව මවුන්ට අදාල වන්නේ නැත.

(ඉ) මෙසේ බඳවා ගනු ලබන ඉල්ලුම්කරුවන් වසර 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිශිෂ්ඨයේ අ (2) හි සඳහන් යෝග්‍යතාපරීක්ෂණය සමත්ව සිටී නම් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව වසර 3 අවසානයේදී මවුන් සේවයේ ස්ථිර කරනු ලැබේ. එකී යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය. ගරු ආණ්ඩුකාරතුමා විසින්

2008.04.02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008.07.2? දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර

5. <u>3 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට උසස් කිරීම (ජ්‍යෙෂ්ඨ බදු නිලධාරීන්)</u>

පරිශිෂ්ඨයේ අ (2) හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් හා 3 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත 3 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් පළාත් ආදායම් සේවයේ 3 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට උසස් කරනු ලැබේ. 3 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් එක් වර්ෂයක සේවා කාලයකින් පසුව පවත්වනු ලබන පරිශිෂ්ඨයේ අ (3) හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එසේ සමත්වන නිලධාරීන් 3 පන්තියේ I වැනි ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබේ. එම උසස් කිරීමෙන් වර්ෂයක් ඉකුත්වීමෙන් පසුව හා වර්ෂ තුනක් ඉකුත්වීමට පෙර පරිශිෂ්ඨයේ අ (3) හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වුවහොත් උසස්වීම් දිනයෙන් පසුව එළඹෙන තුන්වන වර්ෂයේදී අතිරේක වැටුප් වර්ධක දෙකක් ප්‍රදානය කරනු ඇත.

6. <u>2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම - (පළාත් ආදායම් තක්සේරුකරු)</u>

6.1. බඳවා ගැනීම පහත දැක්වෙන පදනම මත වනු ඇත.

(අ) පුරප්පාඩු වලින් 25% ක් 3 වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමෙන් පසු ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගෙන එකී ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙන් පුරවනු ලැබේ. කුසලතාවය මැනීමේ නිර්ණායක පරිශිෂ්ඨයේ ආ (4) හි දැක්වේ.

(ආ) පුරප්පාඩු වලින් 25% ක් පහත සඳහන් නිලධාරීන්ට සීමා වූ සීමිත තරඟ පරීක්ෂණයක (පරිශිෂ්ඨයේ අ (6) හි සඳහන් ) ප්‍රතිඵල මත ඉහලම ලකුණු පදනම් කරගෙන උසස් කිරීමෙන් පුරවනු ලැබේ.

I. 3 වනි පන්තියේ I වැනි ශ්‍රේණියේ නිලධාරීන්,

II. පළාත් අදයම් සේවයේ වසර 03 කට නොඅඩු සේවයක් ඇති හා තනතුරේ ස්ථිර කොට ඇති උපාධිධාරීන් හෝ නිතිඥයින් වන නිලධාරීන්,

III. පළාත් අදයම් සේවයේ වසර 05 කට නොඅඩු සේවයක් ඇති 4 (ආ) වන ජේදයේ සඳහන් කවර හෝ පරීක්ෂණයකින් සමත් නිලධාරීන්,

(ඇ) පුරප්පාඩු වලින් 50% ක් පරිශිෂ්ඨයේ අ (7) හි දැක්වෙන ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහලම ලකුණු පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණයකින් පසුව පහත සඳහන් අයගෙන් පුරවනු ලැබේ.

I වයස අවුරුදු 35 හෝ ඊට අඩු, පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන හෝ දෙවන පන්තියේ උපාධියක් සහිත උපාධිධාරීන් හෝ වරලත් හෝ ඒකාබද්ධ ගණකාධිකාරීන් හෝ (දැනටමත් රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිර කර සිටින නිලධාරීන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.).

II පළාත් අදයම් සේවයේ 3 වන පන්තියේ තනතුරක ස්ථිර කොට ඇති වසර 03 කට නොඅඩු සේවයක් සහිත උපාධිධාරීන්, හෝ නිතිඥයින්,

6.2. 2 වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගනු ලැබූ නිලධාරීන් තනතුරේ ස්ථිරත්වය ලබා ගැනීම සඳහා පරිශිෂ්ඨයේ අ (4) හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පළමු පත්වීමේ දිනයේ සිට අවුරුදු 02 ක් ඇතුලතදී වැඩබලන නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතුය. යෝග්‍යතා පරීක්ෂණය සමත් වීමෙන් පසු වැඩබලන නිලධාරීන් ඔවුන්ගේ ශ්‍රේණියෙහි ස්ථිර කරනු ලබන අතර, පරිවාස කලයකට යටත් නිලධාරීන් ඔවුන්ගේ ශ්‍රේණියෙහි ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා පරීක්ෂණය මෙන්ම වසර 3 ක් ඉකුත්වීමට පෙර ආයතන සංග්‍රහයේ රෙගුලාසිවල සඳහන් පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීනත්වයද ලබාගත යුතුය.

6.3. පළාත් ආදයම් සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගනු ලබන යම් නිලධාරියෙකු එම ශ්‍රේණියට පත් වූ දින සිට වසර 2 ක සේවා කාලයක් ඇතුලත 3 ත් වාරයකට නොවැඩි වාර ගණනකින් පරිශිෂ්ඨයේ අ (4) හි සඳහන් ප්‍රථම දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් විය යුතුය. නියමිත කාලපරිච්ඡේදය තුල එකී දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් අසමත් යම් නිලධාරියෙකු ඔහු කලින් දැරූ තනතුරට හරවා යවනු ලැබේ. කෙසේ වෙතත් 6(I) (අ) ජේදය යටතේ එකී ශ්‍රේණියට උසස් කරනු ලබන අවස්ථාවේ වයස අවුරුදු 55 ඉක්මවූ යම් නිලධාරියෙකු <u>සම්පූර්ණ පුහුණු පාඨමාලාවූ හැදෑරූ</u> ඇති බවට පළාත් ආදයම් කොමසාරිස් සහතික කරන්නේ නම් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් එම නිලධාරියා නිදහස් කෙරේ.

6.4. බඳවා ගනු ලැබූ නිලධාරියෙකු ප්‍රථම දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වී ඇත්නම් ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ ප්‍රකාරව එකී නිලධාරියා ස්වකීය සේවයෙහි ස්ථිර කිරීම සිදුකෙරේ.

6.5. පළාත් ආදයම් සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරියෙකු එම ශ්‍රේණියේ වසර 05 ක සේවය කිරීමෙන් පසු පරිශිෂ්ඨයේ අ (5) හි සඳහන් දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් විය යුතුය. කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් නොවන නිලධාරියෙකුගේ ඉදිරි වැටුප් වර්ධක ගෙවීම නතර කරනු ලැබේ.

07. <u>2 වන පන්තියේ 1 වන ශ්‍රේණියට උසස් කිරීම (පළාත් ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු)</u>

7.1 ජ්‍යෙෂ්ඨත්වය හා සතුටුදායක සේවා වාර්තා පදනම් කරගෙන 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියට උසස් කිරීම සිදු කෙරේ. එසේ වුවද මේ සඳහා නිලධාරියෙකු රු: 352620/-ක වැටුප් තලයට එළඹීම හෝ දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම යන දෙකෙන් පසුව සිදු වන්නේ කවරක්ද එතැන් සිට වසර 04 කට නොඅඩු කාලයක් සම්පූර්ණකර තිබිය යුතුය.

08. <u>1 වන පන්තිය (පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස්)</u>

8.1 සතුටුදායක සේවා හා කාර්යසාධන වාර්තා කෙරෙහි තිසි සැලකිල්ල දක්වමින් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගෙන 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ පස් වසරක සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරීන් උසස් කිරීමෙන් බඳවා ගනු ලැබේ.

8.2 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියෙන් 1 වන පන්තියට උසස් කිරීම සඳහා නිලධාරීන් නොමැති අවස්ථා වලදී.

(අ) වෙනත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවක 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ වසර 05 කට වැඩි සතුටුදායක සේවයක් ඇති නිලධාරියෙකුගෙන් හෝ

(ආ) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයෙන් සම්පූර්ණයෙන් මුදා හැරීමක් ලබාගත හැකි එම සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ වසර 05 කට වැඩි සතුටුදායක සේවයක් ඇති නිලධාරියෙකුගෙන් හෝ පුරප්පාඩු පුරවනු ලැබේ.

09. ඉහතකී 4 සහ 6.1(ඇ) වගන්ති යටතේ බඳවා ගැනීම් සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අවම වශයෙන් මධ්‍යම පළාතේ අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති බවටත්. තමාගේ වයස අවුරුදු 18 ට වැඩි බවටත් අධ්‍යාපනික සුදුසුකම් ..සෞඛ්‍ය හා චරිතය සම්බන්ධයෙන් තමා තිසි සුදුසුකම් ලබා ඇති බවටත් සතුටුදායක සාක්ෂි සෑම අපේක්ෂකයෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ සඳහන් කොන්දේසිද අදාල වනවා ඇත.

10. පිළිවෙලින් 05. 06(1) (අ). 6(2) සහ 6(5) ඡේදයන්හි සඳහන් යෝග්‍යතා පරීක්ෂණ ලිඛිත පරීක්ෂණ වන අතර. එකී පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා අයදුම්කරුවන් සිටී නම් වසරකට දෙවතාවක් පළාත් ආදායම් කොමසාරිස් විසින් විභාග පවත්වනු ලැබේ. එම පුහුණු පාඨමාලා සහ පරීක්ෂණ පැවැත්වීමට යම් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවකට පහසුකම් නොමැති අවස්ථාවලදී පළාත් ආදායම් කොමසාරිස් විසින් කරනු ලබන ඉල්ලීම අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ එම කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි වෙනත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවක් විසින් හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හෝ 2000 අංක 21 දරණ ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීම පණත) මගින් පිහිටුවනු ලැබූ ආයතනය වෙතින් හෝ පවත්වනු ලැබේ.

11. පිළිවෙලින් 04. 06(1)(ආ)සහ 6(1)(ඇ) යන ඡේදයන්හි සඳහන් විවෘත තරඟ විභාග (පරීක්ෂණ) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබනවා ඇත. කෙසේ වුවත් එකී පරීක්ෂණ පැවැත්වීමට තමන්ට අපහසු බවට විභාග කොමසාරිස් ජනරාල් කරුණු දක්වා සිටින්නේ නම් එම පරීක්ෂණ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම මත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් හෝ පවත්වා ගනු ඇත.

12. පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරන හා 10 වැනි (දස වැනි) ඡේදයෙහි සඳහන් කරන පරීක්ෂණ වලින් කිසිවකට පෙනී සිටීමට අදහස් කරන නිලධාරීන් සිටී නම් ඔවුන්ට පුහුණුව හා අධ්‍යාපනය සඳහා අවශ්‍ය යැයි තමා සලකන පහසුකම් පළාත් ආදායම් කොමසාරිස් විසින් සලසා දෙනු ඇත.

13. 10 වැනි (දස වැනි) ඡේදයෙහි සඳහන් පරීක්ෂණ. ඒ එක් එක් පරීක්ෂණය යටතේ සඳහන් කර තිබෙන විෂයයන් පිළිබඳව සැකසෙන ප්‍රශ්නපත්‍ර මගින් කෙරෙනු ඇත. මෙම පරීක්ෂණ පිළිබඳ විස්තර මීට යා කර ඇති පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

14. <u>සාමාන්‍ය</u>

බඳවා ගන්නා සෑම අයදුම්කරුවෙකුම මනා ශරීර සෞඛ්‍යයෙන් හා හොඳ ඇස් පෙනීමෙන් යුතුවද. සේවය සඳහා වෙනත් අයුරින් ශාරීරික වශයෙන් සුදුසුවද සිටිය යුතු වන අතර. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ දක්වා ඇති කොන්දේසි වලට යටත්ව ඔහු සේවය සඳහා සුදුසුදැයි පරීක්ෂා කරනු ලැබීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කෙරෙනු ඇත.

15. <u>සේවා කොන්දේසි</u>

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලට අමතරව. ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද. දෙපාර්තමේන්තු නියෝග වලටද. රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධරයෝ බැඳී සිටිති.

16. <u>විධිවිධාන සලසා නොමැති කරුණු</u>

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති කරුණු මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008 .07. [illegible] දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර [illegible]

## උප ලේඛනය:

| | |
|---|---|
| පළාත් ආදායම් කොමසාරිස් | |
| පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස් | - 1 වැනි පන්තිය |
| පළාත් ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | - 2 වැනි පන්තිය 1 වැනි ශ්‍රේණිය |
| පළාත් ආදායම් තක්සේරුකරු | - 2 වැනි පන්තිය II වැනි ශ්‍රේණිය |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි | - 3 වැනි පන්තිය 1 වන ශ්‍රේණිය |
| බදු නිලධාරි | - 3 වැනි පන්තිය II වැනි ශ්‍රේණිය |

## පරිශිෂ්ඨය

(අ) (1) 3 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය ( 4 වගන්තියේ සඳහන්)

සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය සඳහා වූ එක් ප්‍රශ්න පත්‍රයකි.

(කාලය පැය 01½ යි. ලකුණු 100 යි)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. එක් කොටසකට ලකුණු 50 කි. පළමු කොටස වන බුද්ධි පරීක්ෂණය පළමු විනාඩි 30 ඇතුළත පිළිතුරු සපයා භාර දිය යුතුය. අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා වූ දෙවන කොටස ඉතිරි පැයක කාලය තුළදී පිළිතුරු සැපයිය යුතුය.

(2) 3 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියෙහි ස්ථිර කිරීම සඳහා සහ 3 වැනි පන්තියේ 1 වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ යෝග්‍යතා පරීක්ෂණය

### සාමාන්‍ය බදු දැනීම

පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තු සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන වෙනත් බදු සහ ගාස්තු කෙරෙහි අවධාරණය ඇතිව එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01½ යි. ලකුණු 100 යි)

### බදු කාර්ය පරිපාටිය සහ ආයතන සංග්‍රහය

පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තු සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අනෙකුත් බදු සහ ගාස්තු පරිපාලනයෙහිලා අනුගමනය කෙරෙන ප්‍රධාන කාර්ය පරිපාටි පිළිබඳ සහ ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ I-VII දක්වා වූ පරිච්ඡේද වලින් සහ එහි II කාණ්ඩය ආශ්‍රයෙන් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

### සාමාන්‍ය වාණිජ දැනීම හා ආර්ථික කටයුතු

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු හා ව්‍යාපාර සහ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් මූලික මට්ටමක වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

### පොත් තැබීම

තනි ව්‍යාපාර සඳහා ද්විත්ව සටහන් ක්‍රමය අනුව මූලික පොත් තැබීම පිළිබඳ වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01½ යි. ලකුණු 100 යි)

(3) 3 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියෙහි ස්ථිර කිරීම සඳහා සහ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ යෝග්‍යතා පරීක්ෂණය

### සාමාන්‍ය බදු දැනීම

ඉතා සරල අවස්ථා වලදී පිරිවැටුම් බදු බැදියාව, මුද්දර ගාස්තු සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අනෙකුත් බදු සහ ගාස්තු වල බදු බැදියාව ගණන් බැලීම කෙරෙහි අවධාරණය ඇතිව මෙම විෂයයෙන් එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01½ යි. ලකුණු 100 යි)

2008.06.23
අනුමත කර

**<u>බදු කාර්ය පරිපාටිය</u>**

පිරිවැටුම් බදු, මුද්දර ගාස්තු සහ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අනෙකුත් බදු සහ ගාස්තු පරිපාලනයෙහිලා අනුගමනය කෙරෙන කාර්ය පරිපාටි පිළිබඳ වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

**<u>සාමාන්‍ය වාණිජ දැනීම හා ආර්ථික කටයුතු</u>**

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වාණිජ කටයුතු හා ව්‍යාපාර සහ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

**<u>පොත් තැබීම</u>**

තනි පුද්ගල ව්‍යාපාර සහ හවුල් ව්‍යාපාර සඳහා ද්විත්ව සටහන් ක්‍රමය අනුව මූලික පොත් තැබීම පිළිබඳ වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 ½ යි. ලකුණු 100 යි)

(4) 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියෙහි ස්ථිර කිරීම සඳහා වූ දෙපාර්තමේන්තු පරීක්ෂණය. (ප්‍රථම දෙපාර්තමේන්තු පරීක්ෂණය. - 6:2 ඡේදයෙහි සඳහන්)

**<u>බදු නීතිය</u>**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තු සහ අනෙකුත් බදු සහ ගාස්තු කෙරෙහි අවධාරණය ඇතිව මූදල් ප්‍රඥප්තිය පිළිබව වූ ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 02 යි. ලකුණු 100 යි)

**<u>බදු කාර්ය පරිපාටිය හා බදු පරිපාලනය</u>**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු සහ ගාස්තු සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන කාර්ය පරිපාටිය පිළිබඳව සහ පළාත් බදු පරිපාලනය ආශ්‍රිත සාමාන්‍ය කරුණු පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(කාලය පැය 01 ½ යි. ලකුණු 100 යි)

**<u>ගණකාධිකරණය</u>**

(I) ද්විත්ව සටහන් ක්‍රමය යටතේ ගිණුම් පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්. (සීමිත වගකීම් සමාගම් වල ගිණුම් ඇතුලත් නොවේ.)

(කාලය පැය 02 යි. ලකුණු 100 යි)

(II) අසම්පූර්ණ සටහන් හා තොරතුරු ආශ්‍රයෙන් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 02 යි. ලකුණු 100 යි)

**<u>බදු ආගණනය</u>**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නීතිය අනුව ගිණුම් ගැලපීමෙන් පසු බදු බැඳියාව (සීමිත වගකීම් සමාගම්වල බැඳියාව ඇතුලත් නොවේ.) සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තනි හා හවුල් ව්‍යාපාර වලට අදාල ආදායම් බදු ආගණනය ගණනය බැලීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 02 යි ලකුණු 100 යි)

**<u>සාමාන්‍ය වාණිජ දැනීම, ආර්ථික කටයුතු සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන</u>**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු කෙරෙහි විශේෂ අවධානයක් සහිතව සාමාන්‍ය වාණිජ දැනීම. සාමාන්‍ය මූල්‍ය හා ආර්ථික කටයුතු සහ ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ XXVII සහ XXVIII පරිච්ඡේද හා එහි II කාණ්ඩය සම්බන්ධයෙන් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි ලකුණු 100 යි)

**<u>මධ්‍යම රජයෙන් පාලනය වන බදු</u>**

ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයෙන් පාලනය වන සියලුම බදු වල ප්‍රධාන ලක්ෂණ පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.

(කාලය පැය 01 යි ලකුණු 100 යි)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008 . 06 . 08 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

(5) II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ වසර 05 ක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සඳහා වූ (6:5 වන ඡේදයෙහි සඳහන් ) දෙවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණය.

<u>බදු නීතිය</u>

(1) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන පිරිවැටුම් බදු, මුද්දර ගාස්තු සහ අනෙකුත් බදු සහ ගාස්තු ආශ්‍රිත නඩු නීතිය පිළිබඳව වූ ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 03 යි. ලකුණු 100 යි)

(II) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන පිරිවැටුම් බදු, මුද්දර ගාස්තු සහ අනෙකුත් බදු සම්බන්ධ ව්‍යවස්ථාපිත නීතිය පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 03 යි. ලකුණු 100 යි)

<u>බදු ප්‍රතිපත්ති, බදු පරිපාලනය සහ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>

බදු ප්‍රතිපත්ති, බදු පරිපාලනය සහ මුදල් රෙගුලාසි සංග්‍රහයේ IV, V පරිච්ඡේදයේ (1-4 වැනි කොටස්) සහ VI හා XIV පරිච්ඡේද සම්බන්ධයෙන් වූ එක් ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 02 යි ලකුණු 100 යි)

<u>ගණකාධිකරණය</u>

(I) ද්විත්ව සටහන් අනුසාරයෙන් වූ පොත් තැබීම සහ ගණකාධිකරණය පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 03 යි. ලකුණු 100 යි).

(II) අසම්පූර්ණ සටහන් හා වෙනත් තොරතුරු ආශ්‍රයෙන් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 02 යි. ලකුණු 100 යි)

<u>බදු ආගණනය</u>

ගිණුම් හා තොරතුරු ගැලපීමෙන් බදු බැඳියාව ගණන් බැලීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 03 යි. ලකුණු 100 යි)

<u>පරිගණක භාවිතය</u>

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව මූලික පරිගණක භාවිතය පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

(6) 3 වැනි පන්තියේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන්, පළාත් ආදායම් සේවයෙහි තුන් වර්ෂයකට නොඅඩු සේවා කාලයක් ඇති උපාධිධාරීන් හෝ නීතිඥයින් සහ පළාත් ආදායම් සේවයේ පස් වසරකට නොඅඩු සේවා කාලයක් ඇති 4(ආ) ඡේදයෙහි සඳහන් පරීක්ෂණයෙන් සමත් නිලධාරීන් අතරින් 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ (6(1) (ආ) වන ඡේදයෙහි සඳහන්) පරීක්ෂණය.

<u>සාමාන්‍ය බදු දැනීම</u>

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන පිරිවැටුම් බද්ද, මුද්දර ගාස්තු සහ අනෙකුත් බදු හා ගාස්තු කෙරෙහි විශේෂ අවධානය ඇතිව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු පිළිබඳ සාමාන්‍ය දැනීම පිළිබඳව වූ ප්‍රශ්න පත්‍රයක්.
(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

<u>සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය</u>

සාමාන්‍ය බුද්ධිය මැනීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 01 යි. ලකුණු 100 යි)

(7) II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට ( 6(1) (ඇ) වන ඡේදයෙහි සඳහන් තැනැත්තන් අතරින් ) බඳවා ගැනීම සඳහා වූ ලිඛිත පරීක්ෂණයේ විෂයයන් පහත පරිදිය.

<u>අවබෝධය</u> - අවබෝධය පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 01 $\frac{1}{2}$ යි. ලකුණු 100 යි)

<u>සාමාන්‍ය දැනීම</u> සාමාන්‍ය දැනීම පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 01 $\frac{1}{2}$ යි. ලකුණු 100 යි)

<u>බුද්ධි පරීක්ෂණය</u> බුද්ධි පරීක්ෂණය පිළිබඳව වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(කාලය පැය 01 $\frac{1}{2}$ යි. ලකුණු 100 යි)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008. 08. 
අනුමත කරන ලදී
ආණ්ඩුකාර

<u>අවබෝධය</u>

දෙනු ලබන පාඨයක් හෝ පාඨ කීපයක් කියවා අවබෝධ කර ගැනීම, විශ්ලේෂණය හා ඒවායේ අදහස් ප්‍රකාශ කිරීමත් සාරාංශ කර ප්‍රකාශ කිරීමේ හැකියාව මැන බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රය තුලින් බලාපොරොත්තුවේ.

<u>සාමාන්‍ය දැනීම</u>

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සහ සංවර්ධනයට අදාල ගැටළු ප්‍රමුඛ දේශපාලනඥ්නය, සමාජමය හා සංස්කෘතික රටාව හා ජාතික මෙන්ම අන්තර්ජාතිකවද වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනයද සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

<u>බුද්ධි පරීක්ෂණය</u>

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, තීරණ ගැනීමේ හැකියාවත් විශ්ලේෂණය කිරීම සඳහා සැකසෙන බහුවරණ ක්‍රමයේ ප්‍රශ්න පත්‍රයකි.

(ආ)(1) වෙනත් අයුරකින් නිශ්චිතව දක්වා ඇති අවස්ථාවන්හිදී හැර පරිශිෂ්ඨයෙහි සඳහන් යෝග්‍යතා පරීක්ෂණවල (තරග පරීක්ෂණ නොවන) එක් එක් විෂයය සඳහා සමත්වීමේ ලකුණු මට්ටම 60% ක් වේ.

(2) යම් අයදුම්කරුවෙකු අවස්ථා 03 ක් ඇතුලත යම් පරීක්ෂණයකින් අසමත්වීමෙන් යෝග්‍යතාව ලැබීමට අපොහොසත්වේ නම් ඔහුට ඉන් පසු එම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත. එසේ වුවද, සාධාරණ හේතු මත ඔහුට ඒ සඳහා තවත් අවස්ථාවක් දිය යුතුයැයි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එසේ කල හැක.

(3) අ(1), අ(6), අ(7) යන ඡේදයන්හි සඳහන් කරන පරීක්ෂණවලට ඉහත 1 හා 2 ඡේද අදාල නොවේ.

(4) 1 කුසලතාවය තීරණය විය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලවය.

6.1 (අ) හි සඳහන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය නිශ්චය කරනු ලබන්නේ ලකුණු ලබාදීමේ ක්‍රමයක් මගිනි. ජ්‍යෙෂ්ඨත්වයට උපරිම ලකුණු 40 ක් වෙන් කරනු ලබන අතර, එහිදී III පන්තියේ 1 ශ්‍රේණියේ සේවය කර ඇති පූරා වර්ෂයක කාලයක් සඳහා ලකුණු 40 ක් ලැබේ. කුසලතාවය කොටස් දෙකකින් සමන්විතවේ. පළමුවැන්න පූර්වාසන්න වසර 05 ක කාර්යසාධන වාර්තා පදනම් කරගෙන ලකුණු ලබාදෙන අතර, උපරිම ලකුනු ප්‍රමාණය 20 කි. (එක් වර්ෂයකට උපරිම ලකුනු ප්‍රමාණය 04 කි) දෙවැන්න ලිඛිත විභාගයක් වන අතර, උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. එම විභාගය පරිශිෂ්ඨයේ ආ කොටසේ 4 වන වගන්තියේ සඳහන් විෂය නිර්දේශය පරිදි පවත්වනු ඇත. උපරිම ලකුණු 100 ක් ලැබෙන සේ ම ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ලබන අතර, අපේක්ෂකයින් ලබා ගන්නා ලකුණු උපරිමය 40 ක් වනසේ ප්‍රමිත කරනු ලැබේ. ජ්‍යෙෂ්ඨත්වය, කාර්යසාධන වාර්තා පදනම සහ විභාගය යන ඒවායින් ලබා ගන්නා ලකුණුවල එකතුව ගෙන ඉහලම ලකුනු ලබා ගන්නා පදනම මත පුරප්පාඩු සංඛ්‍යාව සඳහා උසස්වීම් කරනු ලැබේ. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය පහත පරිදි විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008 . 06 . [illegible] දින
අනුමත කරා [illegible]
ආණ්ඩුකාර [illegible]

<u>පළමු කොටස</u>

1960 අංක 17 දරණ මධ්‍යම පළාතේ මුදල් ප්‍රඥප්තිය (ලකුණු 60)

<u>දෙවන කොටස</u>

ආයතන සංග්‍රහයේ පහත සදහන් පරිච්ඡේද (ලකුණු 20)

XII - නිවාඩු
XIV - දිවයින ඇතුලත රාජකාරි ගමන්
XXIV - වැටුප් ණය හා අත්තිකාරම්
XXXII - දේශපාලන අයිතිවාසිකම් භුක්ති විදීම
XLVII - සාමාන්‍ය හැසිරීම හා විනය

<u>තුන්වන කොටස</u> (ලකුණු 20)

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද
I. - වියදම් හා ඇස්තමේන්තු
II. - වියදම් අත්හැර දැමීම. ආපසු ගෙවීම ආදිය සඳහා අධිකාරි බලය.
III. - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව
IV. - ලැබීම්
V. - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය. අග්‍රිම හා බැංකු ගිණුම්.

(කාලය පැය 03 යි ලකුණු 100 යි)

01. [signature]
02. [signature]
03. [signature]
04. [signature]
05. [signature]

අනුමත කරමි / ~~නොකරමි~~.
[signature]
.........................................
පී.බී.ආර්. කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
200.8....7..2.........

ගරු ආණ්ඩුකාරතුමා විසින්
......2008.08.05......දින
අනු...
ආණ්ඩුකාර...